**පළාත් පාලන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ (පුරනැගුම) - 2012**

---

1. <u>මතය.</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2012 ජුලි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ආරම්භක අත්තිකාරම, 2012 ජුලි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>.

2.1 <u>මූල්‍ය කාර්ය සාධනය.</u>

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, ව්‍යාපෘතියේ 2012 ජුලි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වියදම රු.15,771,835 ක් විය. 2012 දෙසැම්බර් 31 දිනට වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2012 ජුලි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වියදම |
|---|---|
| | රු. |
| ලී බඩු, සවි කිරීම්, කාර්යාලයීය උපකරණ සහ පරිගණක දෘඩාංග | 73,095 |

| | |
|---|---|
| මෙහෙයුම් වියදම් | 8,169,360 |
| උපදේශන සේවා | 7,293,093 |
| ප්‍රාග්ධනිත කළ ණය පොලිය | 236,287 |
| | -------------- |
| එකතුව | 15,771,835 |
| | ======== |

2.2 **අග්‍රිම අරමුදල් ගිණුම.**

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2012 ජූලි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| ආරම්භක අත්තිකාරම් ලැබීම් | 500,000 | 66,679,550 |
| අඩු කළා | | |
| ආපසු ගැනීම් | 379,151 | 50,323,373 |
| විදේශ විනිමය අවාසිය | - | 988,977 |
| | ----------- | ------------- |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 120,849 | 15,367,200 |
| | ====== | ======== |

3. **විගණන නිරීක්ෂණ.**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

3.1 ව්‍යාපෘතිය ආරම්භ කිරීම

2011 ඔක්තෝබර් 21 දින ව්‍යාපෘති ගිවිසුමට එළඹුනද, මාස 08 ක ප්‍රමාදයකින් පසු 2012 ජූලි ව්‍යාපෘති කටයුතු ආරම්භ කර තිබුණි.

3.2 ස්ථාවර වත්කම් වාර්තා කිරීම

පළාත් පාලන යටිතල පහසුකම් වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සතු ලී බඩු හා කාර්යාල උපකරණ මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් භාවිතාකරමින් පැවතුණද 2013 ඔක්තෝබර් 30 දින වන විටත් මෙම ව්‍යාපෘතියට මාරු කර හෝ ගිණුම් වාර්තාවලට ගෙන හෝ නොතිබුණි.

3.3 කාර්යසාධනය

ව්‍යාපෘතියේ කටයුතු 2011 තුන්වන කාර්තුව වන විට ආරම්භ කිරීමට නියමිතව තිබුණද, ආරම්භ කර තිබුණේ 2012 ජූලි මාසයේදීය. කෙසේ වුවද, අපේක්ෂිත ඉලක්කයන් ව්‍යාපෘති කාලය තුල නිමකිරීම තහවුරු කර ගැනීම සඳහා සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

තවද, මෙම ක්‍රියාකාරී සැලැස්මේ මූල්‍ය ඉලක්කයන් දක්වා නොතිබීම හේතුවෙන් කාර්යසාධනය අධීක්ෂණය ඵලදායිව කළ නොහැකි විය.